කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව ව්‍යාප්තවීම සහ එයින් උද්ගතවන සමාජ, ආර්ථික බලපෑම් : ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරිනි.

FACULTY OF GRADUATE STUD
RECEIVED
10 SEP 2013
UNIVERSITY OF KELANIYA

යූ.පී. නයනා චන්ද්‍රකාන්ති
BA (Hons.) - Kelaniya

විභාග අංකය : FGS / G / MSSc / 2006 / 16

භූගෝලවිද්‍යා අංශය



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 848 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (භූගෝලවිද්‍යාව) දෑවුරුදු පර්යේෂණ උපාධි පාඨමාලාවේ පරීක්ෂණ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාව

2011 නොවැම්බර්

# සාරාංශය

ජනසංඛ්‍යාව වයස්ගත වීමේ ක්‍රියාවලිය ජනසංඛ්‍යා වර්ධනයේ අත්‍යන්ත ප්‍රතිඵලයකි. එනම් ජනසංඛ්‍යාව වයස්ගත වීම, සාඵල්‍යතාව පහළ යාම හා පහළ මර්ත්‍යතා මට්ටම හේතුවෙන් ඇතිවන ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ අත්‍යන්තයයි. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකාවම සුවිශේෂී සන්ධිස්ථානයකට පිවිස සිටින බව පෙනේ. මෙම තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව සංවර්ධිත රටවල් හා සම මට්ටමකට ළගා වී ඇත. එහෙත් ශ්‍රී ලංකාව පුරා විද්‍යාත්මක වශයෙන් වර්තමානය වනවිට ජනසංඛ්‍යාව වයස්ගත වීම හා සම්බන්ධ ගැටලු රාශියකට මැදි වී සිටී.

ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ පහක් ඇසුරින් කරන ලද මෙම අධ්‍යයනය තුළින් ජනසංඛ්‍යාව වයස්ගත වීම නිසා ඔවුන් රැක බලා ගන්නා පවුලේ සාමාජිකයින්, ආයතනික රැකවරණය සපයන්නන් සේම සමස්ත සමාජ, ආර්ථිකයම විවිධාකාර ගැටලුවලට මුහුණ දෙන බව අවබෝධ විය.

විස්තෘත පවුල බිඳ වැටීම, න්‍යෂ්ටික පවුල් ඇති වීම, පවුලක සිටින දරුවන් ගණන අඩු වීම, ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපාර්ශවයේම ශ්‍රම හමුද සහභාගිත්වය ඉහළ යාම හා සංක්‍රමණය, අඩු ආදයම වැනි විසංවිධිත බලපෑම් නිසා කුටුම්භයකට වයස්ගත වූවන් රැක බලාගැනීම ගැටලුවක්ව පවතී. ඒ අනුව වර්තමානය වන විට ආයතනික රැකවරණය එනම්, මහලු නිවාස පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් සිටී.ජන සංඛ්‍යාව ව්‍යාපත්වීම ආශ්‍රිතව විශේෂයෙන් දිළිඳු කුටුම්භවලට ඔවුන් රැකබලා ගැනීම අපහසු වී ඇත. තවද සමාජිය වශයෙන් බැලූකල කුටුම්භ තුල විවිධ ප්‍රශ්න ඇත. ආර්ථිකමය වශයෙන් ගත් කළ රජයකට විශ්‍රාම වැටුප් , අර්ථසාධක අරමුදල් වැඩි වශයෙන් ගෙවීමට සිදුව ඇත.

එහෙත් වයස්ගත පුද්ගලයා සමස්ත සමාජ ආර්ථිකයට ගැටලුවක් කර නොගෙන ඔවුන් සශ්‍රීක මානව සම්පතක් ලෙස සමාජයට දයාද කරගැනීමේ කාලය එළඹී ඇත. ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වත්මන් සංවර්ධන ක්‍රියාදමය සඳහා යොදගත හැකිය. තව ද සමාජයේ සෑම පුද්ගලයෙක්ම තමාගේ මහලු විය ගත කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් පිළිබඳව තරුණ වියේදීම සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වේ.